# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2314/89 – 2023 ජනවාරි 14 වැනි සෙනසුරාදා – 2023.01.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: : IR / COM / 04 / 2021 / 188.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එච්.එච්.ආර්.කේ.හේරත් මිය, අංක 1551/5/17, අමුඇටමුල්ල පාර, කොට්ටාව, පන්නිපිටිය

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, අංක 170, හයිලෙවල් පාර, නුගේගොඩ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, නුගේගොඩ, කන්දෙවත්ත පටුමග, අංක 24/ඒ, සී.එන්.විතානාච්චි මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජනවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.

1A – G 38581 – 19 (2023/01)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

මගේ අංකය: : IR / COM / 04 / 2021 / 188.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

එච්.එච්.ආර්.කේ.හේරත් මිය, අංක 1551/5/17, අමුඇටමුල්ල පාර, කොට්ටාව, පන්නිපිටිය

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

1. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, අංක 170, හයිලෙවල් පාර, නුගේගොඩ.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ–

'' ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සහකාර අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීමේ දී පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය අනුව ඒ සඳහා ඉදිරිපත් වූ එහි පරිපාලන නිළධාරිනී එච්.එච්.ආර්.කේ.හේරත් මහත්මියට යම් අසාධාරණයක් සිදුව තිබේ ද එසේ අසාධාරණයක් සිදු වූයේ නම් ඒ මහත්මියට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ .''

**බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ,
කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 01/0141

---

මගේ අංකය: : IR / COM / 03 / 2021 / 191.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩබ්.කේ.පී.ජයසේන මයා, අංක 134, මාලොස් ඇල, කුඩා උඩුව, හොරණ

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණප-නත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කුරුණෑගල, මීගමු පාර, ගජබා මාවත, අංක 11, හි ඩබ්.ඒ.බුද්ධික ප්‍රභාත් කරුණාතිලක මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජනවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: : IR / COM / 03 / 2021 / 191.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

ඩබ්.කේ.පී.ජයසේන මයා, අංක 134, මාලොස් ඇල, කුඩා උඩුව, හොරණ

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

1. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ–

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කළ ඩබ්.කේ.පී.ජයසේන මහතා හට රැකියාව අහිමිව සිටි කාලය තුළ එනම්,

* 1996.10.01 වෙනි දින සිට 2002.01.28 දින දක්වා කාලයට වැටුප්,
* 2004.06.01 වෙනි දින සිට 2006.10.17 දින දක්වා කාලයට වැටුප්,
* 1978.09.01 දින සිට 2006.10.17 දක්වා කාලයට නියමිත වාර්ෂික වැටුප් වර්ධක හා
* වසර 20 කට වැඩි කාලයක් සේවය කිරීම වෙනුවෙන් විශ්‍රාම යාමේ දී ලබා දෙනු ලබන වැටුප් වර්ධක දෙක

හිමි ද යන්නත්, හිමි නම් ඒවා ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.

**බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ,
කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 01/0142

---

මගේ අංකය: IR/COM/04/2018/204.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2021.08.12 වැනි දින අංක 2240/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.08.04 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ඩබ්. ඒ. ඩී. බී. සමරවීර මයා, අංක 113, සදහම් මාවත, වල්පොල, අංගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මාර්ග සංවර්ධන අධිකාරිය, "මග නැගුම මහ මැඳුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල.

අතර පවත්නා 2021.08.03 වැනි දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඩබ්. එම්. සෙනෙවිරත්න වීරසිංහ මහතා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු ඩබ්. එම්. සෙනෙවිරත්න වීරසිංහ මයා ධූරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2021.08.04 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජනවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2018/204.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ඩබ්. ඒ. ඩී. බී. සමරවීර මයා, අංක 113, සදහම් මාවත, වල්පොල, අංගොඩ.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මාර්ග සංවර්ධන අධිකාරිය, "මග නැගුම මහ මැඳුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, කොස්වත්ත, රිචඩ් ද සොයිසා නිවාස සංකීර්ණය, අංක 4, හි නීතිඥ පියල් දර්ශන ගුරුගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජනවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2018/204.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ඩබ්. ඒ. ඩී. බී. සමරවීර මයා, අංක 113, සදහම් මාවත, වල්පොල, අංගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මාර්ග සංවර්ධන අධිකාරිය, "මග නැගුම මහ මැඳුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''මාර්ග සංවර්ධන අධිකාරියේ වැඩ අධිකාරි ප්‍රවාහන ලෙස සේවය කළ ඩබ්. ඒ. ඩී. බී. සමරවීර මහතාට යාන්ත්‍රික ඉංජිනේරු තනතුර හිමි ද යන්න හා හිමිනම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඩබ්. ඒ. ඩී. බී. සමරවීර මහතාට හිමි සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 01 - 0143

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.